ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 4 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2- 2023/2024
**LLU 4610-** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II
කාලය - පැය 1

---

දිනය -: **2024** දෙසැම්බර් **11** — වේලාව -: ප.ව. **01.30** – ප.ව **2.30**

---

<u>එක් ප්‍රශ්නයකට පමණක්</u> පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

(1) සුමනා රජයේ පාසලක උගන්වන පාසල් ගුරුවරියකි. පාසලේ විදුහල්පතිනිය පසුගියදා ඇයව විනය භාර ගුරුවරිය ලෙස පත් කළාය. දර්ශනා එම පාසලේ ඉගෙනුම ලබන සිසුවියක් වන අතර ඇය මුරණ්ඩු හැසිරීම් සහිත සිසුවියක් බවට චෝදනා ලද අයෙකි. එක් දිනක් පාසලේ සාමාන්‍ය පරිදි සිදුකරන පාසල් බෑග් පරීක්‍ෂා කිරීමකදී , දර්ශනාගේ බෑගයේ තිබී ජංගම දුරකථනයක් ශිෂ්‍ය නායකයන් විසින් සොයා ගන්නා ලදී.පාසලේ විනය නීතිවලට අනුකූලව පාසලට දුරකථන රැගෙන ඒම තහනම් ය.ශිෂ්‍ය නායකයන් විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් සුමනාව කැඳවූ කල ඇය පාසලේ විනයභාර ගුරුතුමිය වශයෙන් අසභ්‍ය වදන් වලින් ඇයට කෑගසා ශිෂ්‍යනායකයන්ට අණ කරන ලද්දේ දර්ශනාට පාසල් ක්‍රීඩා භූමියේ දණ ගසන ලෙස බලකරන ලෙසයි. ඇයව එලෙස මධ්‍යහන අව්වේ පැය ගණනක් තබා ඇත.දර්ශනා නිවසට පැමිණි පසු දැඩි හිසරදයක් පිළිබඳ මවට පැමිණිලි කළාය.පසුදින හිසරදය සුව නොවූ බැවින් දර්ශනාව රෝහලට රැගෙන ගියාය.ඇයව වැඩිදුර වෛද්‍ය පරීක්‍ෂණ සඳහා රෝහලට ඇතුළත් කරන ලදී.පසුව වෛද්‍යවරු විසින් සොයාගනු ලැබුවේ ඇය මධ්‍යම ස්නායු පද්ධතියට සම්බන්ධ දුර්ලභ රෝගී තත්වයකින් පෙළෙන බවත් එය දිගු වේලාවක් හිරු එළියට නිරාවරණය වීම හේතුවෙන් උග්‍ර වී ඇති බවත් ය. වෛද්‍යවරුන්ගේ මතය වන්නේ එම තත්වය ආපසු හැරවිය නොහැකි දෙයක් බවයි.

ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් සම්බන්ධ නීති තත්වය යටතේ පාසලේ බලධාරීන්ට එරෙහිව යම් ක්‍රියාමාර්ගයක් ගත හැකිද යන්න පිළිබඳව දර්ශනාගේ මව ඔබගෙන් උපදෙස් පතයි.අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය ඇසුරින් ඇයට උපදෙස් දෙන්න.

(ලකුණු 20).

2. "සාම්ප්‍රදායික වර්ගීකරණ මූලධර්මයන්ගෙන් (classification doctrine) වෙනස් වීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානාත්මතා වගන්තිය අර්ථ නිරූපණය කර ඇත."

මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?අදාළ නඩු තීන්දු නීතිය වෙත යොමු වෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20).

***හිමිකම් ඇවිරිණි***